# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1717/18 — 2011 අගෝස්තු 03 වැනි බදාදා - 2011.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය

වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය විජේසිංහ හෙට්ටිඅච්චි මුදියන්සේලාගේ අතුල සරත් කුමාර විජේසිංහ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වූ පහත සඳහන් කරුණු/චෝදනා හේතුකොට ගෙන මහව ප්‍රාදේශීය සභාවේ සභාපති සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා විසින් සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී පනතේ 185 වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදුකර තිබේ ද යන්න පරීක්ෂා කර මාස 03ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාවක් වශයෙන් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඕ. ඩබ්. ඕ. බී. වීරසේන මහතා පත් කරමි.

**පරීක්ෂා කළ යුතු කරුණු/චෝදනා**

*චෝදනා :*

I. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉදිකර ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් වූ ගොඩනැගිලි අයදුම්පත්‍ර අනුමත කිරීමේදී වීථිරේඛා සහතික නිකුත් කිරීම වෙනුවෙන් 2011.05.03 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභාවේ ලදුපත් අංක 79488 මගින් රුපියල් එක්දහස් නවසිය පනස් පහක (රු. 1,955.00) ක මුදලක් අටවරල මහව පදිංචි එම්. ටී. ජලීල් යන අයගෙන් වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2010.07.27 වැනි දිනැති ප.පා.කො/චක්‍රලේඛ අංක 1 2010 උපදෙස්වලට පටහැනිව අය කිරීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1)(අ) හා/හෝ 185(1)(ඈ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදක් සිදු කිරීම

II. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට 2011.06.24 වැනි දින හෝ ඊට ආසන්න දිනයක් දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී මහව ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය සඳහා 2011.04.21 හෝ ඊට අසන්න දිනයක දී අංක 435 දරන ගෙවීම් වවුචරය මගින් මහව ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් රුපියල් විසිදෙදහස් දෙසීය හතලිස් පහක (රු. 22,245.00) මුදලක් ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මතයකින් හා ටෙන්ඩර් කැඳවීමකින් තොරව මහව ලිපිනයේ කේ. එම්. අරුණ පුෂ්කුමාර යන අයට ලබාදීමෙන් 1987 අංක 15 දරන

ප්‍රාදේශීය සභා පනතේ 174 වැනි වගන්තියට පටහැනිව ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1) (ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදුකිරීම

III. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට 2011.06.24 වැනි දින හෝ ඊට ආසන්න දිනයක් දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී මහව ප්‍රාදේශීය සභාවේ අඹන්පොල පෙර පාසලේ දීමනා මත සේවයේ නියුතු අයි. එම්. එස්. කේ. හේරත් යන පෙර පාසල් පාලිකාව 2011.03.01 වැනි දින සිට 2011.04.27 දින දක්වා සේවයට වාර්තා නොකර තිබිය දී එහි කාල සීමාවට අදාලව 2011.05.10 මහව ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් වවුචර අංක 564 මගින් රුපියල් හාරදහස් හයසීයයක් (රු. 4,600.00) ක් හෝ ඊට ආසන්න මුදලක් දීමනාවක් ලෙස 2011.05.10 හෝ ඊට ආසන්න දිනයකදී ප්‍රදානය කිරීමෙන් 1987 අංක 15 දරන පනතේ 184 වැනි වගන්තිය යටතේ පනවන ලද මූල්‍ය හා පරිපාලන රීති 103හි සඳහන් විධිවිධානයන් අනුමගනය නොකර ගෙවීම් කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ඇ) 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

IV. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී මහව ප්‍රාදේශීය සභාවේ දීමනා මත අයි. එම්. එස්. කේ. හේරත් මිය, එල්. එස්. රේණුකා දමයන්ති මිය, ආර්. එම්. මල්ෂා හර්ෂණී මිය පෙර පාසල් පාලිකාවන් ලෙස හා මාලා එස් ටිකිරි කුමාරි මිය පරිගණක ක්‍රියාකරු ලෙස බඳවා ගෙන දීමනා ගෙවීමේදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(i) වගන්තියට පටහැනිව ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

V, 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී සභාවට පැමිණි ප්‍රභූන්ට සංග්‍රහ කටයුතු සඳහා මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මුතියකින් තොරව හා 1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ වයඹ පළාතේ විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියකින් තොරව මහව හොටේල් ශාන්ති ආයතනයට 2011 අප්‍රේල් මස 07 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් රුපියල් විසිදහස් අටසිය විසි හතක (රු. 20,827.00) මුදලක් ගෙවීමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදුකිරීම.

VI. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී, 2011 අප්‍රේල් මස 25 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී අංක 68, මැලිබන් වීදිය, කොළඹ 11, සේසත් ඉලෙක්ට්‍රික් කම්පැණි ආයතනයට මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මතයකින් තොරව මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීමට ලබාගත් විථි පහන් උපකරණ සැපයීම වෙනුවෙන් මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් තිස්අට දහසක (රු. 38,000.00) මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

VII. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටය දී 2011.06.01 දින හෝ ඊට ආසන්න දිනයක දී අංක 68, මැලිබන් වීදිය, කොළඹ 11, සේසත් ඉලෙක්ට්‍රික් කම්පැණි ආයතනයට මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මතයකින් තොරව හා 2011.03.01 වැනි දින ටෙන්ඩර් මණ්ඩල නිර්දේශයට පටහැනි ලෙස මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීමට ලබාගත් වීථි පහන් උපකරණ සැපයීම වෙනුවෙන් මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් හතලිස් හයදහස් එකසිය හතලිස් හයයි ශත විසි පහක් (රු. 46,146.25) මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

VIII. 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී 2011.04.26 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී ආර්. එම්. එල්. කේ. රාජපක්ෂ යන අයට මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මතයකින් තොරව බලල්ල මහජන පුස්තකාලය සහ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා වූ සැළසුම් ඇඳීම සහ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් හැත්තෑ හය දහස් හාරසිය හැත්තෑ පහක් (රු. 76,475.00) ක මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

තව ද 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද

කොමසාරිස්වරයෙකු සතු බලතල මෙම පරීක්ෂණය සඳහා විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඕ. ඩබ්. ඕ. බී. වීරසේන මැතිතුමා වෙත හිමිවන අතර මෙම පත්කිරීමේ දින සිට තුන් මසක කාලයක් ඇතුත් පරීක්ෂණය සිදු කර, පරීක්ෂණ වල නිගමන ඇතුළත් වාර්තාවක් මා වෙත ඉදිරිපත් කළ යුතු බව ද දන්වනු කැමැත්තෙමි.

ඉහත කරුණු පරීක්ෂා කරීමේදී අදාල කරගත යුතු බවට හඳුනාගත් ලිඛිත හා වාචික සාක්ෂි පහත උපලේඛනයට ඇතුළත් කර ඇති බව ද වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

අතුල සරත් කුමාර විජේසිංහ,
වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය පළාත් පාලන හා
පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
ඉඩම් ප්‍රවාහන, පරිසර, සංචාරක ආයෝජන, සම්බන්ධීකරණ,
සමූපාකාර සංවර්ධන හා ආහාර සැපයුම් විෂයභාර අමාත්‍ය.

2011 අගෝස්තු මස 02 වැනි දින,
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*(අ) වාචික සාක්ෂි*

i. එම්. එම්. ආර්. රෝහණ මැදගෙදර මහතා, ගරු උප සභාපති, මහව ප්‍රාදේශීය සභාව
ii. කේ. එම්. මුතුබණ්ඩා මහතා, ප්‍රාදේශීය සභා සභික, මහව ප්‍රාදේශීය සභාව
iii. එච්. පියසේන මහතා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී සභික, මහව ප්‍රාදේශීය සභාව
iv. එච්. එම්. විජිත අමුණුගම මහතා, ප්‍රාදේශීය සභා සභික, මහව ප්‍රාදේශීය සභාව
v. ජයසේන රත්නායක මහතා, හිටපු ප්‍රාදේශීය සභා සභික, මහව ප්‍රාදේශීය සභාව.
vi. ආර්. නිමල් වික්‍රමසිංහ මහතා, ප්‍රාදේශීය සභා සභික, මහව ප්‍රාදේශීය සභාව
vii. එච්. එම්. අබේරත්න මහතා, ප්‍රාදේශීය සභා සභික, මහව ප්‍රාදේශීය සභාව
viii. පරිපාලන නිලධාරි, ඩබ්ලිව්. තන්තිරිගම මහතා, ආයුර්වේද දෙපාර්තමේන්තුව
ix. වැඩ බලන ලේකම්, එච්. විජේතුංග මැණිකේ මහත්මිය, මහව ප්‍රාදේශීය සභාව
x. වැඩසටහන් සහකාර (විමර්ශන නිලධාරි), එච්. එම්. එස්. පී. කේ. හේරත් මහතා, පළාත් පාලන දෙපාර්තමේන්තුව (වයඹ පළාත)
xi. වැඩසටහන් සහකාර (විමර්ශන නිලධාරි), ඩී. පී. ඩී. එන්. කේ. ගුණසේකර මහතා, පළාත් පාලන දෙපාර්තමේන්තුව (වයඹ පළාත)
xii. වැඩසටහන් සහකාර (විමර්ශන නිලධාරි) පී. ඒ. උෂාන්ත රණසිංහ, පළාත් පාලන දෙපාර්තමේන්තුව (වයඹ පළාත)
xiii. වැඩසටහන් සහකාර (විමර්ශන නිලධාරි), පී. පී. අයි. ආර්. ප්‍රනාන්දු, පළාත් පාලන දෙපාර්තමේන්තුව (වයඹ පළාත)
xiv. කාර්මික නිලධාරි, ජී. ඒ. එන්. පෙරේරා මයා, කුරුණෑගල ප්‍රාදේශීය සභාව
xv. කාර්මික නිලධාරි, ඊ. එම්. ගුණතිලක බණ්ඩා මහතා, මහව ප්‍රාදේශීය සභාව
xvi. කළමනාකාර සහකාර ඒ. එච්. එම්. එච්. කේ. අබේරත්න මහත්මිය, මහව ප්‍රාදේශීය සභාව
xvii. එච්. එම්. දිසානායක මහතා, නිර්මාණ වැඩ අධිකාරි, පළාත් පාලන දෙපාර්තමේන්තුව
xviii. පළාත් පාලන නිලධාරි (මූල්‍ය කළමනාකරණ) එන්. ආර්. ඩබ්. ඒ. පී. වන්නිනායක මහත්මිය, මහව ප්‍රාදේශීය සභාව
xix. වැඩසටහන් සහකාර (ගබඩා භාරකරු) ටී. එම්. අයි. ටී. කුමාරසිංහ මහතා, මහව ප්‍රාදේශීය සභාව
xx. ආදායම් පරිපාලක, ජේ. එම්. එස්. විජේබණ්ඩාර මයා, මහව ප්‍රාදේශීය සභාව
xxi. පෙර පාසල් පාලිකා අයි. එච්. එම්. ටිකිරි මැණිකේ මිය, මහව ප්‍රාදේශීය සභාව, අඹන්පොල පෙර පාසල
xxii. එම්. එච්. බී. චන්ද්‍රකුමාර බණ්ඩාර, ඉඹුල්ගොඩයාගම, බලල්ල
xxiii. එච්. එම්. කේ. සමන්ලතා, පළාත් පාලන නිලධාරි, මූල්‍ය කළමනාකරණ
xxiv. ආර්. එච්. කේ. රූපසිංහ මහතා, කළමනාකාර සහකාර, පළාත් පාලන දෙපාර්තමේන්තුව
xxv. එම්. එම්. දුලාෂිණි කෝකිලා, පළාත් පාලන නිලධාරි, පළාත් පාලන දෙපාර්තමේන්තුව
xxvi. අයි. එම්. ස්වර්ණතිලකා, කළමනාකාර සහකාර, මහව ප්‍රාදේශීය සභාව
xxvii. එම්. යූ. දමයන්ති කුමාරිහාමි මිය, පළාත් පාලන නිලධාරි, මහව ප්‍රාදේශීය සභාව
xxviii. ඒ. එම්. සෙනවිරත්න මහතා, අංක 166, කෝන්වැව, ඉපලෝගම, මහව

උපලේඛනය (*සම්බන්ධිතයි*)

xxix. ඩී. එම්. අනුපමා දිසානායක මෙනවිය, කළමනාකාර සහාකාර, මහව ප්‍රාදේශීය සභාව
xxx. ආර්. අයි. බී. සමන් රත්නමලල මහතා, කළමනාකාර සහකාර, මහව ප්‍රාදේශීය සභාව
xxxi. ඩබ්. එම්. එම්. ඩී. වීරසේකර, පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව (වයඹ)
xxxii. එම්. ටී. ජලීල්, අටවරල, මහව.

(ආ) *ලිඛිත සාක්ෂි* :

i. උල්වලපොල මහව පදිංචි එම්. ටී. ජලීල් යන වීරීරේබා අයදුම්පත්‍රය
ii. 2011.01.05 වැනි දින අත් මුදල් ගෙවා ලබාගෙන ඇති මහව ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2011.01.06 වැනි දින සකස් කර 2011.04.21 වැනි දින ගෙවන ලද අංක 435 වැනි වවුචරය හා ඊට අදාල ලිපිගොනුව
iii. මහව ප්‍රාදේශීය සභාවේ අඹන්පොල උප කාර්යාලයේ පැමිණිමේ ලේඛනය
iv. පෙර පාසල් පාලිකාවන්ට ගෙවන ලද 2011.05.23 වැනි දින 564 වැනි වවුචරය (පීඑස් 38 ආකෘතිය)
v. 2010.01.18 සහ 2010.04.23 දිනැති මහ සභා වාර්තා
vi. 2010.07.27 දිනැති ප. පා. කො/චක්‍රලේඛ අංක 1 2010 චක්‍රලේඛය
vii. 2011.05.03 වැනි දිනැති මහව ප්‍රාදේශීය සභාවේ අංක 79488 දරන රු. 1,955.00ක වටිනාකම සඳහන් ලදු පතේ දෙවන පිටපත.
viii. 2011.05.30 මහ සභාවට ඉදිරිපත් කරන ලද රු. 5,000ට වඩා වැඩි ගෙවීම් වාර්තාව (2011.04.30 දින සිට 2011.05.23 දක්වා)
ix. 2011 අප්‍රේල් 07 හොටෙල් ශාන්ති වෙත රුපියල් විසිදහස් අටසිය විසිහතක් ගෙවන ලද 346 දරන වවුචරය හා ඊට අදාළ ලිපිගොනුව.
x. 2011.04.25 දින සේසත් ඉලෙක්ට්‍රික් කම්පැණි වෙත ගෙවන ලද 459 දරන වවුචරය
xi. මහව ප්‍රාදේශීය සභාවට අවශ්‍ය විදුලි උපකරණ ලබා ගැනීම සම්බන්ධ ලිපිගොනුව සහ 2011.03.01 ද ටෙන්ඩර් මණ්ඩල වාර්තාව
xii. 2011.06.01 වැනි දින සේසත් ඉලෙක්ට්‍රික් කම්පැණි වෙත ගෙවන ලද 623 වවුචරය සහ 2011.03.01 වැනි දින ටෙන්ඩර් මණ්ඩල වාර්තාව හා විදුලි උපකරණ ලබා ගැනීම සඳහා ලබා ගන්නා ලද මිළ ගනන්
xiii. 2011.04.26 ආර්. එම්. එල්. කේ. රාජපක්ෂ යන අයට ගෙවන ලද 454 වන වවුචරය හා ඊට අදාල ලිපි ගොනුව
xiv. 2011.01.27 දිනැති මහව ප්‍රාදේශීය සභාවේ බලයලත් නිලධාරියාගේ තීරණ ලිපිය.

08-484

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.